සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

08 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නාට්‍යයකට සුදුසු කතාවක සිදුවීමක තිබිය යුතු අනිවාර්ය ලක්ෂණයක් වන්නේ,

(1) ගැටුම් සහිතව කුතුහලයෙන් යුක්ත වීම. (2) කුතුහලයෙන් යුක්ත නොවීම.
(3) මුල, මැද, අග මනාව නොගැලපීම. (4) විශ්වසනියත්වයෙන් යුක්ත නොවීම.

02 ''අමර ගියා දිව්‍යලෝකෙ'' නාට්‍යයේ අමර ජීවිතය අවබෝධ කරගත්තේ,

(1) අන් අයගේ මඟපෙන්වීමෙනි. (2) කම්මැලිව නිදාගැනීමෙනි.
(3) යහළුවන් හා සෙල්ලම් කිරීමෙනි. (4) ඔහු ලැබූ අත්දැකීමක් අනුවය.

03 නාට්‍යයකදී චරිතය ඉදිරිපත් කිරීමට නළුවාට පරිබාහිරව එක්කරගන්නා සියලුදේ

(1) ආංගික අභිනයට අයත් වේ. (2) ආහාර්ය අභිනයට අයත්වේ.
(3) වාචික අභිනයට අයත්වේ. (4) සාත්වික අභිනයට අයත්වේ.

04 ශරීරයේ අංග, ප්‍රත්‍යංග, උපාංග යනාදී වූ කොටස් මගින් රූපණ ශිල්පියා අදහස් ප්‍රකාශ කිරීම

(1) ආංගික අභිනයයි. (2) වාචික අභිනයයි.
(3) සාත්වික අභිනයයි. (4) ආහාර්ය අභිනයයි.

05 දුටුගැමුණු රජුගේ ජීවන චරිතය ඇසුරුකරගත් කතා

(1) සුරංගනා කතා වේ. (2) ජනකතා වේ.
(3) හාස්‍යෝත්පාදක කතා වේ. (4) ඓතිහාසික කතා වේ.

06 අද්භූත කතාවක් වන්නේ,

(1) හීල්බත් දංකුඩ කතාව (2) යසලාලක තිස්ස කතාව
(3) බෝංචි වැලේ කතාව (4) අන්දරේ සීනි කෑ කතාව

07 නාට්‍ය පෙළ රචනයේ දී පරිකල්පනය වඩා වැදගත්වේ. ඉන් අදහස් වන්නේ,

(1) ඇති කතාව ඒ ආකාරයෙන් ඉදිරිපත් කිරීම.
(2) අලුතින් යමක් සිතා නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම.
(3) ගැටුම් සහිතව නාට්‍ය පෝෂණය කිරීම.
(4) චරිත අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ඇතිකිරීම.

08 නාට්‍යයක නළුවරණය යනුවෙන් අදහස් කරන්නේ,

(1) නළු නිළියන් තෝරාගැනීම. (2) චරිත පුහුණු කිරීම.
(3) සංවාද කියවීම. (4) ඇඳුම් පැළඳුම් නිර්මාණය

09 නාට්‍යයක රූපණය යනුවෙන් අදහස් කරන්නේ,

(1) චරිතයක් නිරූපණය කිරීමයි. (2) සංවාද භාවිතා කිරීමයි.
(3) පිටපත කියවීමයි. (4) රංග අභ්‍යාස සිදුකිරීමයි.

10 මෙම නාට්‍ය අතර ළමා නාට්‍යයක් නොවන්නේ,

(1) පුංචි අන්දරේ (2) තොප්පි වෙළෙන්දා

(3) නරිබෑණා (4) පොල්ගෙඩියට ජරමරේ

11 නාට්‍ය පිටපතක අත්‍යවශ්‍ය අංගය නොවන්නේ,

(1) සංවාද (2) ආලෝකකරණය (3) රංග විධාන (4) චරිත

12 වේෂභූෂණ යනුවෙන් හඳුන්වන්නේ,

(1) චරිතය නිරූපණයයි. (2) මුහුණ සකස් කිරීමයි.

(3) පසුතල නිර්මාණය කිරීමයි. (4) ඇඳුම් පැළඳුම් නිර්මාණයයි.

13 වළහා හා මාෂා නාට්‍යයේ තේමාවක් නොවන්නේ,

(1) හැම අයෙකු තුළම යහගුණ ඇති බව (2) නරක අය යහපත් වන බව

(3) අවිහිංසාවාදි නොවීම (4) නපුරු ළමයින් ප්‍රතික්ෂේප වීම

14 සිරුරේ සියලු අඟ පසඟ සහිතව ශරීරය සම්පූර්ණයෙන් සැහැල්ලු වීම

(1) ශිථිලකරණ අභ්‍යාසයයි. (2) දර්පණ අභ්‍යාසයයි.

(3) ස්වසන අභ්‍යාසයයි. (4) තාපන අභ්‍යාසයයි.

15 කටහඬ අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා

(1) නම්පොත හා බුදුගුණ අලංකාරය කියවිය යුතුය.

(2) බුද්ධ ගජ්ජය හා සකස්කඩ කියවිය යුතුය.

(3) සකස්කඩ හා ලෝවැඩ සඟරාව කියවිය යුතුය.

(4) ගුත්තිල කාව්‍ය හා නම්පොත කියවිය යුතුය.

16 හේ ආලේ හෙලයියෝ
මණ්ඩිරාළේ හෙලයියෝ
පාරුව මූදට හෙලයියෝ
තල්ලුකරන් හෙලයියෝ

මෙම ගීතය

(1) පාරු කවියකි. (2) යාතුකර්ම කවියකි.

(3) වැදි ගීයකි. (4) දැල් ගියකි.

17 ''දේව දූතයන්ගේ පැමිණීම''

(1) ළමා නාට්‍යයකි. (2) බෞද්ධ නාට්‍යයකි. (3) පාස්කු නාට්‍යයකි. (4) කෙටි නාට්‍යයකි.

18 ඉග්නේෂස් ලොයෙලා මුණිවරයාගේ කතාව තේමාකොට නිෂ්පාදිත නාට්‍ය වන්නේ,

(1) සාන්තුවර සෙබලාණෝය (2) මරිය මවුන් පැමිණීමය

(3) ස්වර්ණතිලකාය (4) සඳකිඳුරුය

19 පබාවතී, ලෝමහංස, කඳාවළලු ආදී නාට්‍ය

(1) ඉස්ලාම් ආගමික කතාවන් වේ. (2) ක්‍රිස්තියානි ආගමික කතාවන් වේ.

(3) හින්දු ආගමික කතාවන් වේ. (4) බෞද්ධාගමික කතාවන් වේ.

20 නාට්‍ය හා රංගකලාව විෂය හදාරන ඔබ තුළ නොතිබිය යුත්තේ,

(1) සාමූහික හැඟීම තිබිය යුතුය. (2) සබකෝලය තිබිය යුතුය.

(3) එකිනෙකා අගය කිරීම සිදුකළ යුතුය. (4) දරාගැනීමේ ශක්තිය තිබිය යුතුය.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01 පහත සංවාද ඛණ්ඩය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මේ ගෙදර කවුරුහරි ඉන්නවා හරිම පිළිවෙලයි.

කෑම මේසයක් නිදාගන්න ඇඳක් ලස්සන මල් පෝච්චියක්

කෑම මේසය උඩ පැණි බේරෙන මී වද කෑල්ලක්

හරිම බඩගිනියි.......

(i) ඉහත සංවාද ඇතුළත් නාට්‍ය නිර්මාණ ශිල්පියාගේ නම කුමක් ද? (ලකුණු 01)

(ii) එම නාට්‍යයේ තේමා 2 ක් ලියන්න. (ලකුණු 02)

(iii) නාට්‍යයේ සිද්ධි පෙළගැසී ඇති ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

(iv) එම නාට්‍යයේ චරිත 4 ක් නම් කරන්න. (ලකුණු 03)

02 (i) රූපණය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) සතර අභිනය නම්කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(iii) නාට්‍යයකදී සතර අභිනය යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

03 (i) වේෂභූෂණ යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) පංති කාමරයේ දී සරළ ලෙස වේෂභූෂණ නිර්මාණය කිරීමට යොදාගන්නා අමුද්‍රව්‍ය 5 ක් ලියන්න. (ලකුණු 03)

(iii) වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු සඳහන් කරන්න. (ලකුණු 05)

04 (i) දූල් ගී යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) දේශීය තොවිල් සම්ප්‍රදායන් තුන නම් කරන්න. ශාන්තිකර්ම 3 ක් ලියන්න. (ලකුණු 04)

(iii) දූල් ගීයක්, වැදිගීයක් හෝ ශාන්තිකර්ම ගීතයක් ලියන්න. (ලකුණු 04)

05 (i) නාට්‍ය සඳහා යොදාගත් ජාතක කතා 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම එක් කතාවක් චරිත, රංග විධාන, ගැටුම්, සංවාද සහිතව ඔබ කැමති පරිදි කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 4 ) 03. ( 2 ) 04. ( 1 ) 05. ( 4 ) 06. ( 3 ) 07. ( 2 ) 08. ( 1 ) 09. ( 1 ) 10. ( 3 )
11. ( 2 ) 12. ( 4 ) 13. ( 3 ) 14. ( 1 ) 15. ( 2 ) 16. ( 4 ) 17. ( 3 ) 18. ( 1 ) 19. ( 4 ) 20. ( 2 )

## II කොටස

01 (i) ඩී. කුමාරගේ (ල. 01)

(ii) නපුරු ළමයින් නිරන්තරයෙන් ප්‍රතික්ෂේප වන බව / අවිහිංසාවෙහි ඇති වැදගත්කම (ල. 02)

(iii) වළහාගේ නිවසට මාෂා පැමිණීම / මී වදය කෑම, නිදාගැනීම / මී මැස්සන් පැමිණීම / වළහා මාෂා ආච්චි බැලීමට යාම / ආච්චි හමුවීම, මාෂා බේරීම ආදී ලෙස ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

(iv) වළහා, මාෂා, ආච්චි, මී මැස්සෝ (ල. 03)

02 (i) රූපණය යනු චරිතයක් නිරූපණය කිරීමයි. (ල. 02)

(ii) ආංගික, වාචික. සාත්වික, ආහාර්ය ලෙස නම්කර කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

(iii) සතර අභිනය යොදාඇති ආකාරය කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

03 (i) නළුවා පළඳිනු ලබන ඇඳුම් හා පැලඳුම් යන අදහස ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)

(ii) රෙදි, කෝඩ් නූල්, තීන්ත වර්ග, හාඩ්බෝඩ්, බ්‍රිස්ටල් බෝඩ්, ඇටවර්ග, කම්බි ආදී ලෙස ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) ශෛලියට ගැලපිය යුතුය / චරිතයට උචිත අයුරින් නිර්මාණය කළ යුතුය / හැද පැළඳ ගැනීමට හැකි අයුරින් නිර්මාණය කළ යුතුය / කාලයට. දේශයට. යුගයට ගැලපිය යුතුය (ල. 05)

04 (i) වෙරළේ දැල් අදින මිනිසුන් විසින් දැල ගොඩට ඇදීමේ දී ගයන ගීත (ල. 02)

(ii) උඩරට - කොහොඹා කංකාරිය / පහතරට - රටයකුම / සබරගමුව - මඩු ශාන්තිකර්ම (ල. 04)

(iii) අදාළ ගීයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

05 (i) සේරිවාණිජ, කුස ජාතකය, වෙස්සන්තර, ලෝමහංස (ල. 02)

(ii) නාට්‍ය පිටපත නිර්මාණය කිරීම (ල. 08)